ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම
අවසාන පරීක්ෂණය 2008
කම්කරු නීතිය - LWU 3323/4323/4314

කාලය - පැය තුනයි.

---

දිනය - 2008 අප්‍රේල් 01 වන දින        වේලාව - පෙ.ව. 09.30 - ප.ව. 12.30 දක්වා

---

**ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**
**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ**

01. අජිත් තම මෝටර් රථය කොළඹ කුලී රථ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන 'පෙට් කැබ්' සහ සමාගමට කුලියට ලබා දුන්නේ ය. අජිත් මෝටර් රථය නඩත්තු කරනු ලැබූ අතර, මාසය තුල භාර ගන්නා ලද කුලී ප්‍රමාණය පදනම් කොටගෙන ඔහුගේ ගෙවීම් ගණනය කරන ලදි. ඔහු විසින් සමාගමේ වර්ණයෙන් මෝටර් රථය වර්ණ ගැන්විය යුතු වූ අතර එහි සමාගම් ලාංඡනයද ඇතුලත් කල යුතු විය. එසේම ඔහු විසින් සමාගමේ නිල ඇඳුම පැලඳ සිටිය යුතු විය. එසේම මෝටර් රථය මුළුමනින්ම සමාගමේ සේවය සඳහා යෙදවිය යුතු විය.

'පෙට් කැබ්' සහ සමාගම කිසිදු හේතු දැක්වීමකින් තොරව අජිත් සමග පැවති ගිවිසුම අවසන් කලේය.

සමාගමේ සේවකයකු ලෙස අජිත්ට කිසියම් සහනයකට හිමිකම් ඇත්තේ ද යන්න සාකච්ඡා කරන්න.

02. "ශ්‍රී ලංකාවේ කම්කරු නීති මගින් කාන්තා සේවිකාවන් ආර්ථිකමය වශයෙන් සූරා කෑමෙන් සහ ලිංගික අතවරයන්ගෙන් ප්‍රමාණවත් පරිදි ආරක්ෂා කරනු ලබයි."

ඉහත සඳහන් ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

03. වරුණි, බොතේජු සහ සමාගමෙහි විධායක නිලධාරිනියක ලෙස 2000 ජුනි මස 1 වනදා සිට සේවය කළාය. සේවකයන් 40 දෙනෙකුගේ පමණ කාර්යයන් ඇය විසින් අධීක්ෂණයට ලක් කරන ලදී. 2007 සැප්තැම්බර් මස 23 වන දින රාජකාරි කටයුත්තකට සහභාගි වී ආපසු කාර්යාලයට පැමිණෙමින් සිටියදී ඇය රිය

අනතුරකට භාජනය වී රෝහල් ගත කරනු ලැබුවා ය. මසක පමණ කාලයක් ප්‍රතිකාර ලබමින් සිටි බැවින් එම කාලය තුල ඇයට සේවයට වාර්තා කිරීමට නොහැකි විය. ඇය රෝගාතුරව සිටි කාලය සඳහා සමාගම විසින් වැටුප් නොගෙවන ලදී.

සමාගමේ අධ්‍යක්ෂවරයකුගේ දියණියක වන ක්‍රිෂාන්ති ද ඇයගේ තනතුරට සමාන පදනමකින් යුතුව කටයුතු කිරීම සඳහා පත්කොට ඇති බව නැවත සේවයට වාර්තා කිරීමෙන් අනතුරුව ඇයට දැන ගන්නට ලැබුණි. ක්‍රිෂාන්ති සෑම අවස්ථාවකදීම වරුණිගේ බලය අවතක්සේරු කරන ලද අතර අනෙකුත් කාර්ය මණ්ඩලය සහ සුළු සේවකයන් හමුවේ ඇය දැඩි ලෙස දෝෂ දර්ශනයට ලක් කළාය.

සමාගම තුල පවතින මෙම සේවා පරිසරය පිළිබඳව වරුණි තම අකමැත්ත සමාගමේ කළමනාකාරීත්වයට දැනුම් දුන්නා ය. එහෙත් මේ සම්බන්ධයෙන් කළමනාකාරීත්වය කිසිදු පියවරක් නොගන්නා ලද අතර තත්ත්වය වඩාත් අයහපත් සහ දරාගත නොහැකි එකක් බවට පත්විය. වරුණි වැඩ පිළිබඳව ආතතිය හේතුකොටගෙන හටගන්නා දරුණු හිසරදයකින් පෙළුණු අතර එය හේතුකොට ගෙන කාර්යාලයට යෑමට පවා අකමැති විය. වෛද්‍යවරයෙකු හමුවූ විට ඇයට ඒ සඳහා ප්‍රතිකාර නියම කරන ලදී.

සමාගමෙ කළමනාකාරීත්වයට මෙම තත්ත්වය පිළිබඳ සම්පූර්ණ විස්තර ලිපියක් මගින් දැන්වූ වරුණි මෙම තත්ත්වය දිගටම පැවතුනහොත් තමා සේවයෙන් ඉවත්වීමට කල්පනා කරන බව දැන්වූවාය.

ක්‍රිෂාන්ති වැඩි වැඩියෙන් වරුණිහට සතුරු ලෙස සැලකීමට පටන් ගත්තාය.

තවත් මසක පමණ කාලයක් මෙම තත්ත්වය විඳදරා ගත් වරුණි 2008 මාර්තු මස 10 වන දින රැකියාවෙන් ඉල්ලා අස්වූවාය. සමාගමෙන් කිසියම් සහනයක් සහ /හෝ ප්‍රතිලාභ ලබාගත හැකි දැයි වරුණි අපේක්ෂා කරයි.

ඇයට උපදෙස් දෙන්න.

04. "වැඩ වර්ජන කිරීමේ අයිතිය සේවකයන් සහ ඔවුන්ගේ වෘත්තිය සමිතිවලට ඇති මූලික අයිතිවාසිකම්වලින් එකකි. මෙය තම සාමූහික ආර්ථික සහ සාමාජීය අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා ඇති අයිතිවාසිකම්වල අත්‍යවශ්‍ය අංගයකි."

ඉහත ප්‍රකාශයෙහි හඳුනාගත හැකි අයිතිවාසිකම/අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සතුටුදායක නෛතික ප්‍රතිපාදන ඇත්දැයි පැහැදිලි කරන්න.

05. "ග්ලූ ෆික්ස්" සමාගම නිමල් සහ සුනිල් අනියම් සේවකයන් ලෙස 2007.03.01 දින සිට සේවයෙහි යෙදවීය. සමාගම ඔවුන්ගේ සේවය 2008.03.01 වනදින අවසන් කළේය. සමාගම විසින් සුනිල් පරිවාසිකයකු ලෙස 2008.03.03 වන දින සිට නැවත සේවයෙහි යොදවනු ලැබීය. අකාර්යක්ෂමතාවය සහ අදක්ෂතාවය මත සමාගම සුනිල් ගේ සේවය 2008.03.21 වන දින සිට අවසන් කළේය.

නිමල් සහ සුනිල් ඔවුන් සේවය කල අවුරුද්දක කාලය තුල වැඩ කරන සෑම දිනකම සේවයට වාර්තා කළහ. මොවුන් වැඩ කල කාලය තුල සමාගම විසින් සේවකයන් දස දෙනෙකු සේවයේ යොදවා තිබූ අතර, නිමල් සහ සුනිල් අනෙකුත් සේවකයන් සමග ඉතාමත්ම මිත්‍රශීලිව කටයුතු කළහ.

ඔවුන්ගේ කාර්යයන් පිළිබඳව සෑහීමකට පත් වූ ඉහළ නිලධාරියා මෙම දෙදෙනාගේ වැටුප් වර්ධක ද නිර්දේශ කළේය.

නිමල් සහ සුනිල් සිය සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් සහන ලබා ගැනීමට බලාපොරොත්තු වෙති.

ඔවුන්ට උපදෙස් දෙන්න.

06. "1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනත කාර්මික ආරවුල් විසඳීම සහ සාමකාමී කම්කරු සබඳතා පවත්වා ගෙන යාම සඳහා සාර්ථක යාන්ත්‍රණයක් සපයයි."

ඔබ ඉහත ප්‍රකාශය සමග එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරු සඳහා හේතු දක්වන්න.

07. පළතුරු බීම සහ ජෑම් නිෂ්පාදනය සඳහා ආරම්භ කරනු ලැබූ සී ෆෲට් සමාගම එහි කාර්යාලය සඳහා පිරිමි සේවකයන් හතර දෙනෙකු සේවයට බඳවා ගැනීමට අපේක්ෂා කරයි. කම්කරු නීති යටතේ සේවකයන්ට අදාල සේවා නියම හා කොන්දේසි සහ ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ සමබන්ධව ඇති ප්‍රතිපාදන පිළිබඳව සමාගමේ කළමනාකාරීත්වය ඔබගෙන් උපදෙස් පතයි.

අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් උපදෙස් දෙන්න.

08. පහත සඳහන් කරුණු ගැන සටහන් ලියන්න.

(අ) සේවා ගිවිසුම්හි ස්වභාවය වෙනස් කිරීමට හේතු වූ වර්ධනයන්

(ආ) ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රධාන සම්මුතීන්හි අන්තර්ගත මූලධර්මයන්

- හිමිකම් ඇවිරිණි. -